# සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
# சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
# Department of Samurdhi Development

ග්‍රාමීය සංවර්ධන , සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය
கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டுகை அமைச்சு
Ministry of Rural Development, Social Security and Community Empowerment


| මගේ අංකය<br>எனது இல<br>My No | DSD/HO/MF/05/08/01/ චක්‍රලේඛ | ඔබේ අංකය<br>உமது இல<br>Your No | ............................................ | දිනය<br>திகதி<br>Date | 2025.10.22 |
|---|---|---|---|---|---|

**සමෘද්ධි ප්‍රජාමූල බැංකු චක්‍රලේඛ අංක - 2025/10 ට පළමු එකතුව**

**සියළුම සමෘද්ධි ප්‍රජාමූල බැංකු පාලක මණ්ඩල/බැංකු සමිති විධායක කමිටු සභාපතිවරුන්,**
**සමෘද්ධි ප්‍රජාමූල බැංකු කළමනාකරුවන්/බැංකු සමිති කළමනාකරුවන්,**

**<u>ප්‍රජා සවිබලගැන්වීම් වැඩසටහන - 2025 යටතේ හඳුනාගත් අස්වැසුම සමාජ ප්‍රතිලාභ ලබන අඩු ආදායම්ලාභීන් සඳහා සමෘද්ධි සවිබල ණය යෝජනා ක්‍රමය හඳුන්වාදීම හා සමෘද්ධි ප්‍රතිලාභ ලැබූ අඩු ආදායම්ලාභීන් වෙනුවෙන් සමෘද්ධි රන්පත ණය යෝජනා ක්‍රමය යටතේ ණය ලබාදීමට අවසර ලබාදීම</u>**

01. ප්‍රජා සවිබලගැන්වීම වැඩසටහන යටතේ 2025 වර්ෂයට අදාල ඉලක්ක පවුල් වල ජීවනෝපාය ප්‍රවර්ධනය වෙනුවෙන් ණය පහසුකම් සලසාදීම අරමුණින් 2025.08.07 දිනැති චක්‍රලේඛ අංක - 2025/10 මගින් "සමෘද්ධි සවිබල" හා "සමෘද්ධි රන්පත" ණය යෝජනා ක්‍රම හඳුන්වා දී ඇත.

02. මෙම ණය වැඩසටහන් යටතේ ණය පහසුකම් ලබාදිය යුත්තේ, සමෘද්ධි චක්‍රලේඛ අංක 2025/01 හි සඳහන් පරිදි **<u>හඳුනාගනු ලබන ඉලක්ක ප්‍රතිලාභී පවුල් 50 සඳහා පමණක් බව</u>** තවදුරටත් දන්වමි.

මේ අනුව, සමෘද්ධි සවිබල ණය සඳහා රජයේ අරමුදලින් ලබාදෙන පොළී සහන මුදල්, සවිබල ගැන්වීමට හඳුනාගත් අස්වැසුම ප්‍රතිලාභී පවුල් වලට පමණක් හිමිවන වරප්‍රසාදයක් බවද දන්වමි.

03. සමෘද්ධි සවිබල ණය යෝජනා ක්‍රමයේ දි, පොළී ගණනය කිරීම , හීනවන ශේෂ ක්‍රමයට (Reducing Method) සිදු කර, ණය මුදලේ වාරිකය සමඟ මාසික පොලී මුදල සමාන වාරික ලෙස අය කරනු ලැබේ . ඒ අනුව පරිගණක මෘදුකාංග පද්ධතිය මගින් ණය අය කිරීමේ ලේඛණය (loan schedule ) සකස් කර ඇත.

04. සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් සමෘද්ධි බැංකු වෙත ලබා දෙන සහන පොළී මුදල් මේ සමඟ ඇති සංශෝධිත ඇමුණුම 01 අකෘතිය පමණක් භාවිතා කර ඉල්ලීම් කළ යුතුය.

05. සමෘද්ධි ප්‍රජාමූල බැංකු චක්‍රලේඛ අංක 2025/10 හි ඡේද අංක 16 සඳහන් 2021/ 06 (නව) යන්න , 2025/16 ( නව) ලෙස සංශෝධනය විය යුතුය.

06. උක්ත සංශෝධන මෙපමණ වන අතර, අනිකුත් උපදෙස් සඳහා සමෘද්ධි ප්‍රජාමූල බැංකු චක්‍රලේඛ අංක 2025/10 උපදෙස් වලංගු කර ගන්නා ලෙසද දන්වමි.

සී.ඩී කළුආරච්චි,
අධ්‍යක්ෂ ජනරාල්.

**පිටපත් :-**

01. ලේකම් - ග්‍රාමීය සංවර්ධන , සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය - කා.දැ.ස.
02. දිස්ත්‍රික් ලේකම්/ දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - කා.දැ.ස.
03. ප්‍රධාන අභ්‍යන්තර විගණක, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව. - අ.ක.ස.
04. දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය. - දැ.ස.හා අ.ක.ස.
05. ප්‍රාදේශීය ලේකම්වරුන්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය. - අ.ක.ස.
06. දිස්ත්‍රික් නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - අ.ක.ස.
07. සමෘද්ධි මහා සංගමය සභාපති ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලය - කා.දැ.ගැ.ස.


**1වන අදියර,4 වන මහල , සෙත්සිරිපාය , බත්තරමුල්ල. / 1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல / 1st Step, 4 th floor, Sethsiripaya Battaramulla**

| | අධ්‍යක්ෂ ජනරාල්<br>பணிப்பாளர் தலைமையதிபதி<br>Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන)<br>மேலதிக பணிப்பாளர் தலைமையதிபதி ( நிர்வாகம்/தாபனம்)<br>Additional Director General (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී<br>பிரதான கணக்காளர்<br>Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය)<br>பணிப்பாளர் (குறு நிதி )<br>Director (Micro Finance) | කාර්යාලය<br>அலுவலகம்<br>Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2869824 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dgsamurdhi@gmail.com | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | **Hot Line:0112-885582** | **Hot Line: 011- 2887722** |
| | | **Hot Line :0112-889007** | | | |

ඇමුණුම - 01

කළමනාකරු,
සමෘද්ධි ප්‍රජාමූල බැංකුව,
....................................
2025............................

අධ්‍යක්ෂ(ක්ෂුද්‍ර මූල්‍ය),
සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව,
සෙත්සිරිපාය,
බත්තරමුල්ල.

<u>සමෘද්ධි සවිබල ණය වැඩසටහන සඳහා සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් සහන පොළී මුදල් ඉල්ලුම් කිරීම</u>.

සමෘද්ධි ප්‍රජාමූල බැංකුවේ නම :-...................................................................
විද්‍යුත් ලිපිනය ..........................................................................................

| පොළී මුදල ඉල්ලුම් කරන කාලය | ලැබිය යුතු සහන පොළී මුදල් ගිණුම - ස. සං.දෙ (3198) පවතින ශේෂය (රු.) | ඉල්ලුම් කරන පොළී මුදල (රු.) |
|---|---|---|
| 20------ දින සිට 20---------- දක්වා | | |

ඉහත ඉල්ලම් කරන සහන පොළී මුදල ට අදාල බැංකු පරිගණක මෘදුකාංග සහතික පිටපතක් ද මේ සමඟ එවා ඇත.

02. ඒ අනුව, ඉහත කාලයට ආදාලව සමෘද්ධි ප්‍රජාමූල බැංකුවට ලැබිය යුතු සහන පොළී මුදල චක්‍රලේඛ උපදෙස් පරිදි ගණනය කර ඇති බවත්, අදාල මුදල වන රු. ........................./=.............................බැංකුවේ අංක ……………................දරණ ජංගම ගිණුමට බැර වන සේ චෙක්පතකින් ලබාදෙන ලෙස ඉල්ලා සිටිමි.

03. තවද, 20 ....... දින සිට 20........ දක්වා වූ කාලයට ආදාල ඉල්ලුම් කරන ලද රු................. මුදල සමෘද්ධි ප්‍රජාමූල බැංකුවට ලැබී ඇත / නැත

| <u>සකස් කළේ</u> | <u>සහතික කළේ</u> |
|---|---|
| නම :- | නම :- |
| තනතුර :- | අත්සන :- |
| අත්සන :- | දිනය :- |

- **අනවශ්‍යා වචන කපා හරින්න**